ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
**Sri Jayawardenapura Education Zone**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2019<br>**First Term Test 2019** | 13 ශ්‍රේණිය<br>**Grade 13** |
| පෙරදිග සංගීතය I<br>**Eastern Music I** | පැය 2.00<br>**2.00 hrs** |

---

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතුයි.**

**වඩාත් සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01 විචාරකයන් විසින්සංගීතය, යතාරූපී සංගීතය සහ ව්‍යවහාරික සංගීතය වශයෙන් කොටස් දෙකකට බෙදනු ලබන අවස්ථා ඇත. මින් යතාරූපී සංගීතය වශයෙන් හඳුන් වන කොටසට අයත් ගී විශේෂයකි.

(1) **ටෙලි නාට්‍ය ගී** (2) **චිත්‍රපට ගී** (3) **සරල ගී** (4) **වේදිකා නාට්‍ය ගී** (5) **බයාල් ගී**

02 නිර්මාණ කරනයේ දී බටහිර සංගීත ශිල්පාංග දේශීය අනන්‍යතාවයට ගැලපෙන අයුරින් සුවිශේෂීව යොදාගෙන බිහි කළ නිර්මාණයකි.

(1) **සත් සමුදුර** (2) **මානස විල** (3) **බෙර හඬ** (4) **නරි බෑනා** (5) **මනමේ**

03 සරල ගී නිර්මාණයේදී බොහෝ විට ගීතයේ පදමාලාව ගැයෙන ප්‍රධාන ගී තනුව මතම, ඊට ගැලපෙන අයුරින් වෙනත් නාද මාලාවක් වාදනය කරනු අසන්නට ලැබේ. මෙම කොටස හඳුන්වන්නේ.

(1) **ඉන්ට(ර්)ලූඩ්** නමිනි. (2) **ඉන්ට්‍රොඩක්ෂන්** නමිනි (3) **කෝඩ්ස්** නමිනි
(4) **කවුන්ට(ර්)** පොයින්ට් නමිනි. (5) **ස්කේල්** නමිනි.

04 බටහිර සංගීතයට අනුව ඉහලම හඬතලය කුමක්ද?

(1) Bass (2) Soprano (3) Alto (4) Tenner (5) Mezzo -Soprano

05 කර්ණාටක සංගීතයට අයත් නොවන සංගීත භාණ්ඩය කුමක්ද?

(1) **වීණාව** (2) **සටම්** (3) **නාදස්වරම්** (4) **තවිල්** (5) **පඛවාජ්**

**අංක 06 සිට 15 තෙක් ඇති ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු වඩාත් නිවැරදි වචන යොදන්න.**

පතල් ගී, බඹර කැපීමේ ගී සහ ගැල් ගී වල රිද්මය හෝ තාලය හෝ අනුව(06)...........................ගී වශයෙන්ද, තනු අනුව (07)................................ පැදි වශයෙන් ද වර්ග කල හැකිය. ගැමි සමාජයේ මස්සිනාට වැඩි විස්වාසයක් ලබා දී ඇති බව කියැවෙන වෘත්තිය හා බැඳි ගී වර්ගය (08)...............................ලෙසද, ගද්‍ය හා පද්‍ය කොටස් ඇතුලත් ගැමි ගායනා (09) ................................ලෙසද, හඳුන්වයි. කෙත ආශ්‍රිතව නිර්මාණය වූ ගැමි ගී වශයෙන් ගොයම් ගී සහ (10).............................නම් කල හැකිය.සබරගමු වන්නම් නාමිකව සංඛ්‍යාවෙන් (11)..................................ක් වන අතර පහතරට වන්නම් සංඛ්‍යාවෙන් (12)....................................කි. පදය, තානම, කවිය (13)...................................... වශයෙන් (14).............................. වන්නමක කොටස් හතරකි. පහතරට ශාන්තිකර්ම වල දී වස් දොස් නිම කිරීමට යොදා ගත් ශාන්ති කර්මය (15).................................නම් වේ.

**වඩාත් සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

16 නිර්මාණශීලී සංගීතඥයෙකු තුල තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයකි.

(1) මානව හිතවාදී ගුණය (2) ස්වර රාග තාල පිළිබඳ ඥානය (3) පෙර අපර දෙදිග සංගීත ඥානය
(4) ගායන වාදන හැකියාව (5) ප්‍රස්ථාර කරණයේ සුවිශේෂී හැකියාව.

17 හේවිසි වාදනය සඳහා අවශ්‍ය වන භාණ්ඩ වන්නේ,
(1) ගැටබෙරය,දවුල,තම්මැට්ටම (2) දවුල,තම්මැට්ටම,තාලම්පට (3) දවුල,ගැටබෙරය,හොරණෑව
(4) තම්මැට්ටම,දවුල,හොරණෑව (5) හොරණෑව,තම්මැට්ටම,ගැටබෙරය

18 පසන් ගී වල නාදමාලාවට බෙහෙවින් සමාන කමක් ඇත්තේ කුමන ජන ගී විශේෂයකද?
(1) ගැල්ගී (2) දරුනැලවිලිගී (3) වැලපුම්ගී (4) කෙලිගී (5)ගොයම්ගී

19 නෙළුම් ගී සහ කමත් ගී වලට බෙහෙවින් නෑකම් කියන ගී වර්ගය කුමක්ද?
(1) ගැල් ගී (2) පැල් ගී (3) පතල් ගී (4) පාරු ගී (5) ගොයම් ගී

20 ඉතාමත් අඩු ලයකින් යුතුව ද, ආසාතාත්මකවද උච්ඡ ස්වරයෙන් හා පිරිසකගේ අත්වැල් ගායනය සමග ඉදිරිපත් කරනු ලබන මෙහෙ ගී විශේෂය වන්නේ.
(1) ගොයම් ගී (2) නෙළුම් ගී (3) කමත් ගී (4) කුරක්කන්ගී (5) තුන්සරණේ ගී

21 කෙටි විරිත් ලක්ෂණය හා වැඩි ලයකින් ගායනය කිරීමේ ස්වභාවය ඇතුලත් ගී වර්ගය වන්නේ
(1) ගොයම් ගී (2) නෙළුම් ගී (3) කමත් ගී (4) කුරක්කන් ගී (5) තුන්සරණේ ගී

22 රිදම්,බේස්,ලීඩ් යන අංග තුනම යොදා ගනිමින් සුළඟේ ආධාරයෙන් ගීතයක් වාදනය කල හැකි ස්වර පුවරු සංගීත භාණ්ඩය කුමක්ද?
(1) පියානෝව (2) සර්පිනාව (3) මෙලෝඩිකාව (4) බැන්ජෝව (5) එකෝඩියන්

23 තුම්බා යන විශේෂ කොටස ඇතුලත් නොවන සංගීත භාණ්ඩය වන්නේ.
(1) සිතාර් (2) සරෝද් (3) එස්රාජ් (4) සාරංගි (5) සන්තූර්

24 සිතාර් වාදනයට ඇතුලත් නොවන අංගය කුමක්ද?
(1) තානාලංකාර (2) ජෝඩ් ආලාප (3) ජලා (4) උපජ් (5) ගත්

25 තාල පදයක පිහිටන ගුණාංග තුනෙන් මිති සහ ලය යන්ගෙන් සමාන තාල පද දෙක වන්නේ.
(1) කෙහෙර්වා සහ ත්‍රීතාලය (2) ඒක්තාලය සහ චෞතාලය (3) ධමාර් සහ චෞතාලය
(4) ජප්තාලය සහ දීප්චන්දිතාලය (5) ඒක්තාලය සහ ත්‍රීතාලය

26 කර්ණාටක සංගීතයේ ශුද්ධ ස්වර සප්තකය උත්තර භාරතීය සංගීතයට අනුව කුමන ස්වර වේද?
(1) ස<u>රි</u>ගමප<u>ධ</u>නි (2) සරි<u>ග</u>මපධ<u>නි</u> (3) ස<u>රි</u> <u>ග</u>මප<u>ධ</u> <u>නි</u> (4) සරි<u>ග</u>මප<u>ධ</u> <u>නි</u> (5) සරිගමපධනි

**පහත දැක්වෙන වගුවේ (අ) කොටසෙහි දැක්වෙන ගායනා ශෛලීයට (ආ) කොටසෙහි දැක්වෙන විශේෂ ලක්ෂණය සම්බන්ධ වේ. ඒවා ගලපා ප්‍රශ්න අංක ඉදිරියෙන් ලියන්න.**

| අ | ආ |
|---|---|
| **(1)** ගසල් | වෛතාල් මත නිර්මිතය. |
| **(2)** ඛයාල් | දෙගුණ තෙගුණ වශයෙන් ගුණ කරයි. |
| **(3)** ධ්‍රැපද් | තබ්ලා බෝල් ගායනය කරයි. |
| **(4)** තරාණා | විලම්භ,මධ්‍ය සහ ධ්‍රැත ගීත ඇත. |
| **(5)** ධමාර් | සරල ශාස්ත්‍රීය ගායන ශෛලියකි. |

27 (1)........................................................


28 (2)........................................................

29 (3)........................................................

30 (4)........................................................

31 (5) ........................................................

**පහත දැක්වෙන රූප සටහන ඇසුරින් අංක 32 සිට අංක 35 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




32 ඉහත දැක්වෙන ස්වර පුවරුවේ **1,3,5,6,8,10,12,13** අංකනයන්ට අයත් ස්කේලය (Scale) නම් කරන්න
...........................................................................

33 **1,5,8,12** අංකනයන්ට අදාල කෝඩ් (Chord) එක නම් කරන්න ..............................

34 **1,4,8,11** අංකනයන්ට අදා කෝඩ් (Chord) එක නම් කරන්න ..................................

35 **1,5,9** අංකනයන්ට අදාල කෝඩ් (Chord) එක නම් කරන්න ....................................

**වඩාත් සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

36 පරිගණකයෙහි මූලික උපාංග අතුරින් කොටසකි,
(1) RAM (2) Monitor (3) VDC Card (4) MODEM (5) Hard disk

37 සිස්ටම් යුනිට් කොටසට ඇතුලත් උපාංගයකි,
(1) Monitor (2) Key board (3) Mother board (4) Mouse (5) Speaker

38 පරිගණකය නිර්මාණය වී ඇති මූලික කොටස් දෙක අතුරින් එක් කොටසක් වන්නේ,
(1) Hard ware (2) System unit (3) MODEM (4) MP3 (5) Process

39 තොරතුරු තාක්ෂණයේදී ක්‍රියාවලි කරවීමට සහයවන උපාංගයකි,
(1) Soft ware (2) MIDI (3) MODEM (4) VDA Card (5) Process

40 පරිගණකය ඇසුරින් නිම වන සංගීත නිර්මාණයක, අවසන් අවස්ථාව (Out put ) ගබඩා කෙරෙන, ෆයිල් ෆෝමැට් වර්ගයකි,
(1) Store (2) Hard disk (3) MP3 (4) VGA Card (5) RAM

**කෙටි පිළිතුරු සපයන්න**

41 බටහිර සංගීතයේ **ස්ට්‍රින්ග්ස් ඉන්ස්ට්‍රුමන්ට්** (strings instrument) ගණයට අයත් වන සංගීත භාණ්ඩයක් වන්නේ ................................................ ය.


42 එම සම්ප්‍රදායට අයත් **වුඩ්වින්ඩ් රීඩ්ලස්** ගණයට අයත් වන සංගීත භාණ්ඩයක් ලෙස ................................................සංගීත භාණ්ඩය නම් කල හැකිය.

43 එම වර්ගී කරණයට අනුව **සිම්බල්** යන වාද්‍ය භාණ්ඩය අයත් වන්නේ......................................වර්ගයටය.

44 **ට්‍රම්පට්** යන සංගීත භාණ්ඩය....................................වර්ගයට අයත්වේ.

45 වයලින් පවුලේ **චෙලෝ** වාදන භාණ්ඩය.................................යන හඬ තලයට අයත් වේ.

**පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්ථාරයේ අක්ෂර වලින් කියවෙන සංකේත නම් කරන්න.**




46 (A)............................................... 49 (D) ...............................................
47 (B) ............................................... 50 (E) ...............................................
48 (C) ...............................................